
# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# Registrar General's Department



## කාර්ය සාධන වාර්තාව හා ගිණුම් - 2017
## செயல்திறன் அறிக்கை மற்றும் கணக்குகள் - 2017
## Performance Report & Accounts - 2017

No. 234/A3, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka
Tel : 011 – 2 889488-89 / Fax No : 011 – 2 889491
E-mail : info@gov.lk / Web : www.rgdept.lk

RGD©ICTA/TD/AB/21

# ~ ~ පටුන ~ ~


- ❁ **කාර්ය සාධන වාර්තාව හා ගිණුම් (සිංහල)**
- ❁ **செயல்திறன் அறிக்கை மற்றும் கணக்குகள் (தமிழ்)**
- ❁ **Performance Report & Accounts (English)**

- ❁ **ගරු ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගේ පණිවිඩය**
- ❁ **ගරු ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය**
- ❁ **රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගේ පණිවිඩය**
- ❁ **දෙපාර්තමේන්තුවේ ව්‍යුහය**
- ❁ **අපගේ දැක්ම සහ මෙහෙවර**

1. **I වන පරිච්ඡේදය**
   - 1.1. දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා ක්‍රියාකාරකම්
   - 1.2. අනුෂාංගික ක්‍රියාකාරකම්
   - 1.3. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය
   - 1.4. පනත් සහ ආඥා පනත්

2. **ලේඛන ලියාපදිංචි කිරීමෙන් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහාය වෙමු**

   **II වන පරිච්ඡේදය**

   **ලේඛන ලියාපදිංචි කිරීම**
   - 2.1. නොතාරිස්වරුන් පිළිබඳ විස්තර
   - 2.2. 2016 වර්ෂය තුළ නිකුත් කළ නොතාරිස් බලපත්‍ර සංඛ්‍යාව
   - 2.3. ඉඩම් ලේඛන ලියාපදිංචි කිරීමේ දෝෂ නිවැරදි කිරීම
   - 2.4. දිරාපත් ඉඩම් ලේඛන නැවත සකස් කිරීම
   - 2.5. ලේඛන ලියාපදිංචිය
   - 2.6. ලේඛන සංරක්ෂණය
   - 2.7. ඉල්ලුම් පත්‍ර ලැබීම්
   - 2.8. දෙපාර්තමේන්තුව විසින් අයකර ගන්නා ලද ගාස්තු ප්‍රමාණයන්

3. **ඔබගේ ඉඩමේ හිමිකම අපි වඩාත් තහවුරු කරන්නෙමු**

**III වන පරිච්ඡේදය**

**හිමිකම් ලියාපදිංචි කිරීම**

3.1. හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ කාර්යාල

3.2. පුහුණු වැඩසටහන්

3.3. මූල්‍ය සහ යටිතල පහසුකම්

3.4. පසුගනුදෙනු ලියාපදිංචි කිරීමේ ප්‍රගතිය

3.5. දෙපාර්තමේන්තුව විසින් අයකර ගන්නා ලද ගාස්තු ප්‍රමාණයන්

3.6. ***E- land Register*** වැඩසටහන

4. **විවාහ උපත් සහ මරණ ලියාපදිංචි කිරීමෙන් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහාය දෙමු**

**IV වන පරිච්ඡේදය**

**සිවිල් ලියාපදිංචි කිරීම**

4.1. රෙජිස්ට්‍රාර්වරු

4.2. ලියාපදිංචි කරන ලද විවාහ, උපත් සහ මරණ සංඛ්‍යාව

4.3. විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල මගින් ලියාපදිංචි කරන ලද විවාහ, උප්පැන්න හා මරණ සංඛ්‍යාව

4.4. විවාහ, උප්පැන්න හා මරණ සහතික සහ අනුමාන වයස් සහතික සංඛ්‍යාව

4.5. පිටපත් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීම්

4.6. වි.උ.ම ලේඛන පරිවර්තන නිකුත් කළ පිටපත් සංඛ්‍යාව

4.7. අනුමත කරන ලද ප්‍රකාශ පත්‍ර පිළිබඳ තොරතුරු

4.8. නිකුත් කරන ලද අනුමාන වයස් සහතික සංඛ්‍යාව

4.9. විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල මගින් ලද ප්‍රකාශ පත්‍ර මත අනුමත කල ප්‍රකාශ පත්‍ර සංඛ්‍යා

4.10. විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල මගින් ලද උඩෘත සහ පිටපත් ඉල්ලීම්

4.11. දරුකමට හදාවඩා ගැනීම් සම්බන්ධව තොරතුරු

4.12. මුද්දර ගාස්තු හා වෙනත් ගාස්තු

5. **V වන පරිච්ඡේදය**

උප්පැන්න, මරණ සහ විවාහ සහතික පරිගණක භාවිතයෙන් සහතික පත් නිකුත් කිරීම

6. **VI වන පරිච්ඡේදය**

**දෙපාර්තමේන්තුවෙන් සපයනු ලැබූ විශේෂ සේවාවන්**

6.1. ජනතා සත්කාරක සේවා

6.2. කාර්යාල පහසුකම් වැඩිදියුණු කිරීම

6.3. කරන ලද විශේෂ වැඩසටහන්

7. **ගිණුම් සාරාංශය**

**VII වන පරිච්ඡේදය**

ගිණුම් සාරාංශය



## ස්වදේශ කටයුතු ගරු අමාත්‍ය
## වජිර අබේවර්ධන

ජනතා පරමාධිපත්‍ය ඉටුවන පරිදි ප්‍රජාතන්ත්‍රවාදය කේන්ද්‍රකරගෙන රාජ්‍ය සේවකයින් විසින්, රජයේ සැලසුම් හා තීරණ ගැනීමේ ක්‍රියාවලියට දායක කර ගැනීමට, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ද, පුරවැසි අවශ්‍යතාවයන්ට වගවීමෙන් හා පාරදෘශ්‍යභාවයෙන් යුතුව ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් හඳුනා ගත හැකිය.

21 වන ශතවර්ෂයට ගැලපෙන පරිදි නව තාක්ෂණික ක්‍රම උපයෝගී කරගනිමින් මූල්‍ය ප්‍රතිපත්ති අනුව කටයුතු කරමින් පුරවැසියන්ගේ බදු මුදල් වියදම් කරන ආකාරය සහ එහි කාර්ය සාධනය මැනීමට හැකිවන පරිදි ප්‍රසිද්ධ කිරීම වැදගත් කාර්යයක් වේ.

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ජනතාවට වඩාත් සමීප පුළුල් සේවාවක් කිරීමේ පරමාර්ථයෙන් මේ වන විටත් පියවර රාශියක් ගෙන ඇත. ජනතාව නිලධාරීන් පසුපස යනවා වෙනුවට නිලධාරීන් ජනතාව ළඟට ගොස් සේවය කිරීමේ ජනපති ජනතා සේවය, ජාතික වැඩසටහනක් ලෙස ආරම්භ කළ "නිල මෙහෙවර" සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ද සක්‍රීයව දායකත්වය දරමින් පුරවැසි අවශ්‍යතාවයන් ඉටුකර දීමට ක්‍රියා කරමින් සිටී.

රාජ්‍ය සේවයේ යුතුකම් හා වගකීම් ඉටුකරමින් මා හා එක්ව ජනහිතවාදී ආකර්ෂණීය සේවයක් ලබාදීමට කැපවෙන අමාත්‍යාංශ ලේකම් සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලයට ස්තූතිවන්ත වෙමි.

.



## ස්වදේශ කටයුතු අමාත්‍යංශයේ ගරු ලේකම්
## එස්.ටී. කොඩිකාර

සෑම පුමවැසියකුම අවශෙ‍්‍යයන්ම සම්බන්ධතා පැවැත්විය යුතු රාජ්‍ය ආයතනයක් වශයෙන් රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව ඉතාම සුවිශේෂී තැනක සිටී. මේ වන විට වසර 154 ක් දිවයින පුරා පිහිටි ශාඛා කාර්යාල 45 කින් එම සුවිශේෂී සේවාවන් සපයනු ලැබේ. ඒ සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 332 ක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ක සහාය ද නිල වශයෙන් ලැබේ.

මේ වනවිට පරිඝනක තාක්ෂණය යොදා ගනිමින් වඩාත් කාර්යක්ෂම හා ඉහළ ගුණාත්මක භාවයකින් සේවා සැපයීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය යටතේ  දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති කිහිපයක්ම පසුගිය වසරවල ආරම්භ කරන්නට යෙදුනි. එම ආයෝජන වල ප්‍රතිඵල විශාල වශයෙන් 2017 වර්ෂය වන විට ජනතාවට ලැබී ඇති බව මෙම වාර්තාව තුලින් පැහැදිලි වේ. උප්පැන්න, මරණ සහ විවාහ සහතික පරිඝණක භාවිතයෙන් කඩිනමින් නිකුත් කිරීම දිවයින පුරා පිහිටි සියලුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල මගින් සිදුවන අතර මහජනතාවගේ ඉඩම් වල පත්ඉරු පරිඝනකයෙන් ලබාදීමේ කාර්යයට ද දෙපාර්තමේන්තුව ඇවැසි පියවර ගනිමින් සිටී.

අපගේ සියලුම සේවාවන් පරිඝනක තාක්ෂණය යොදා ගනිමින් වඩාත් කාර්යක්ෂම හා ගුණාත්මක බවින් යුතුව නොපමාවම ලබා දීමට කටයුතු යොදා ඇත. සේවා ලාභීන් අපේක්ෂිත සේවාවන් සාර්ථකව සැපයීම් සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් ඇතුළු සමස්ථ කාර්යය මණ්ඩලය වෙතින් ලැබී ඇති සහයෝගය ඉතාමත් අගය  කරමි. ඉදිරියටත් කාර්යක්‍ෂම ජනතා සේවාවක් සැපයීම සඳහා ගරු ස්වදේශ කටයුතු අමාත්‍ය වජිර අබේවර්ධන මැතිතුමාගේ උපදෙස් හා මඟ පෙන්වීම යටතේ අවශ්‍ය උපරිම කැපවීම සිදු කරනු ලබන බව සතුටින් සඳහන් කර සිටිමි.



## රෙජිස්ට්‍රාර් ජනරාල්
## එන්.සී. විතානගේ

වර්ෂ 1864 දී පිහිටුවනු ලැබූ මෙම දෙපාර්තමේන්තුව දැනට වසර ***154*** ක ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියමින් අපගේ දැක්ම තුළින් හුදු මහජනතාවගේ සිවිල් අයිතිවාසිකම් ආරක්ෂා කර ලියාපදිංචි කිරීම පෙර දැරී කොට ගෙන ශ්‍රී ලංකාද්වීපය නිශ්චල හා චංචල දේපලවලට අදාළ නීත්‍යානුකූල ලේඛන හා හිමිකම් ලියාපදිංචි කිරීම සහ ජන ජීවිතයේ මූලික ගෘහස්ත සිදුවීම් මත විවාහ,උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමෙන්ද එම ලේඛන සංරක්ෂණය කිරීමෙන් ද එම ලේඛනවලින් සහතික පිටපත් නිකුත් කිරීමෙන් ද යන අයිතීන් රැක ගැනීම තුළින් හුදු ජනයාට සපයන අපගේ මෙහෙවර සනිටුහන් වන අතර ඒ සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගේ සහ එම අමාත්‍යාංශයේ මගපෙන්වීම හා උපදේශකත්වය මහඟු පිටිවහලක් වී තිබේ

1867 වර්ෂයේ සිට හුදු මහජනතාවගේ සිවිල් අයිතීන් වූ විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පැවතුන ද 1992 වර්ෂයේ දී වඩාත් කඩිනම් සේවයක් සැපයීමත් වඩාත් පහසුවෙන් කටයුතු ඉටු කර ගැනීමට පහසුවීමත් සඳහා සිවිල් ලියාපදිංචි කිරීමේ කටයුතු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දක්වා විමධ්‍යගත කරන ලදී. ඒ අනුව දිවයින පුරා ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 332 ක් මගින් සිවිල් ලියාපදිංචි කිරීමට අදාළ කටයුතු ඉටු කිරීම සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීම වේගවත් කර ඇති අතර එතුළින් විවාහ, උප්පැන්න සහ මරණ සහතික පරිලෝකනය කර ඉතා කෙටි වේලාවකින් සහතික පිටපත් නිකුත් කිරීමේ වැඩ සටහනින් ද ජනයාට මහඟු සේවයක් වනු ඇත.

ලේඛන ලියාපදිංචිය හා හිමිකම් ලියාපදිංචිය සඳහා දිවයින පුරා පිහිටුවා ඇති ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල 45 ක් මගින් මහජනතාවට අවශ්‍ය සේවාවන් ඉටු කරනු ලබන අතර 1998 වර්ෂයේ අංක 21 දරණ ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීම ද මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇති කාර්යයකි.

මෙම සිවිල් ලියාපදිංචි කිරීමේ කටයුතු අධීක්ෂණය සහ ව්‍යවස්ථාපිත කාර්යයන් ඉටු කිරීම සඳහා කලාප කාර්යාල 07ක් මගින් වඩාත් සමීපව කඩිනමින් ජනතාවට සේවාවන් සැපයීමේ පුරෝගාමී දෙපාර්තමේන්තුවක් ලෙස කටයුතු සිදු කරනු ඇත.

එමෙන්ම මේ වන විට බොහොමයක් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල එක් දිනකදී ඔප්පු ලියාපදිංචි කිරීම සිදු කරන අතර දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ මුල් පිටුවේ සපයා ඇති ඔප්පු ලියාපදිංචි කිරීම යටතේ අදාළ තොරතුරු ඇතුළත් කිරීමෙන් අදාළ ඔප්පු ලියාපදිංචි වී ඇතිදැයි යන වග දැනගත හැකි වීම තුළින්ද ජනතාවගේ කටයුතු පහසු කරලීමට අපහට හැකිවී තිබීම අභිමානවත් සතුටකි.

එලෙස ඉහත කටයුතු මෙතෙක් ඉතා සාර්ථකව ඉටු කරගෙන ආ නමුත් වර්තමාන ලෝකය හා ගැටෙමින් විද්‍යුත් තාක්ෂණික රාජ්‍ය සේවයක් ඇති කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය යටතේ ***e-BMD*** හා ***e***-ජනගහන ව්‍යාපෘති සහ ***e-LR*** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම තුළින් ජනයාට මහගු සේවයක් කිරීමට හැකි වී ඇත. තවද ඔවුනගේ අවශ්‍යතාවයන් සඳහා උපදෙස් ලබා දීම සඳහා විද්‍යුත් වෙබ් අඩවිය මගින් ද අවස්ථාව උදා කර දී ඇති අතර ඒ තුළින් මෙම දෙපාර්තමේන්තුවෙන් සපයනු ලබන සේවාවන් පිළිබඳව දේශීය ප්‍රජාවට මෙන් ම ජාත්‍යන්තර ප්‍රජාවට ද අවස්ථාව ලැබී ඇත.

යහපත් රාජ්‍ය සේවයක් සැපයීම තුළින් මෙම දෙපාර්තමේන්තුව වඩාත් කාර්යක්ෂම, නිරවුල් සහ සුහදශීලීව ඉටු කිරීමට මඟ පෙන්වීමට හැකි වීම පිළිබඳව මා අතිශයින් සතුටට පත් වෙමි.

# දෙපාර්තමේන්තුවේ ව්‍යුහය

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාලය

### කලාප කාර්යාල 07

- 01 උතුර කලාප කාර්යාලය
- 02 නැගෙනහිර කලාප කාර්යාලය
- 03 දකුණ කලාප කාර්යාලය
- 04 බස්නාහිර කලාප කාර්යාලය
- 05 මධ්‍යම කලාප කාර්යාලය
- 06 ඌව සබරගමුව කලාප කාර්යාලය
- 07 වයඹ උතුරු මැද කලාප කාර්යාලය

### මධ්‍යම ලේඛනාගාරය

### ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 45

- 01 අම්පාර
- 02 අනුරාධපුරය
- 03 අත්තනගල්ල
- 04 අවිස්සාවේල්ල
- 05 බදුල්ල
- 06 බලපිටිය
- 07 මඩකලපුව
- 08 හලාවත
- 09 කොළඹ
- 10 දෙල්කඳ/නුගේගොඩ
- 11 ඇල්පිටිය
- 12 ඇඹිලිපිටිය
- 13 ගම්පොල
- 14 ගම්පහ
- 15 ගාල්ල
- 16 හෝමාගම
- 17 හොරණ
- 18 හම්බන්තොට
- 19 යාපනය
- 20 කළුතර
- 21 කල්මුණේ
- 22 කිලිනොච්චිය
- 23 කුරුණෑගල
- 24 කුලියාපිටිය
- 25 කෑගල්ල
- 26 කොටපොල
- 27 මහනුවර
- 28 මතුගම
- 29 මාතලේ
- 30 මන්නාරම
- 31 මාතර
- 32 මාරවිල
- 33 මොණරාගල
- 34 මුලතිව්
- 35 මීගමුව
- 36 නුවරඑළිය
- 37 නිකවැරටිය
- 38 පානදුර
- 39 පුත්තලම
- 40 පේදුරුතුඩුව
- 41 පොළොන්නරුව
- 42 රත්නපුර
- 43 තංගල්ල
- 44 ත්‍රිකුණාමලය
- 45 වව්නියාව

### ප්‍රාදේශීය ලේකම් කාර්යාල 320
(දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් අංශය)

# දැක්ම

*ලියාපදිංචිය හා සබැඳි අයිතිවාසිකම් ආරක්‍ෂා කර ගැනීමට ජනතාවට සහාය වීම*

# මෙහෙවර

*ශ්‍රී ලංකාවේ නිශ්චල හා චංචල දේපළ වලට අදාල නීත්‍යානුකූල ලේඛන හා හිමිකම් ලියාපදිංචි කිරීම සහ*

*ජන ජීවිතයේ මූලික ගෘහස්ථ සිදුවීම් වන විවාහ ,උපත් සහ මරණ ලියාපදිංචි කිරීමෙන්ද,*

*එම ලේඛන සංරක්ෂණය කිරීම සහ එම ලේඛන වලින් සහතික පිටපත් නිකුත් කිරීමෙන්ද,*

*අයිතීන් රැක ගැනීම පිණිස ජනතාවට සහාය වීම.*

# I පරිච්ඡේදය

## 1.1 දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා ක්‍රියාකාරකම්

ප්‍රධාන කාර්යයන් තුනකි.

1.1.1 ලියාපදිංචි කිරීම.

1.1.2 භාරකාරත්වය සහ ලේඛන සංරක්ෂණය.

1.1.3 සහතික පිටපත් නිකුත්කිරීම.

## 1.1 <u>ක්‍රියාකාරකම්</u>

1.1.1 ලියාපදිංචි කිරීම

- ➢ ලේඛන ලියාපදිංචි කිරීම
- ➢ නිශ්චල) ඉඩම් (දේපළ වලට අදාළ ලේඛන ලියාපදිංචි කිරීම
- ➢ චංචල දේපළ වලට අදාළ ලේඛන ලියාපදිංචි කිරීම
- ➢ ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීම

1.1.2 හිමිකම් ලියාපදිංචි කිරීම

- ➢ නිශ්චල දේපළ වලට අදාළ හිමිකම් ලියාපදිංචි කිරීම

1.1.3 සිවිල් ලියාපදිංචි කිරීම

- ➢ ශ්‍රී ලංකාව තුළ සිදුවන සියලුම විවාහ, උපත් හා මරණ ද, විදේශයන්හි දී සිදුවන ශ්‍රී ලාංකිකයන්ගේ විවාහ, උපත් සහ මරණ ද ලියාපදිංචි කිරීම.
- ➢ ළමයින් දරු කමට හදා ගැනීමේ අධිකරණ නියෝග ලියාපදිංචි කිරීම සහ එම ළමයින්ගේ උපත නැවත ලියාපදිංචි කිරීම.
- ➢ උඩරට විවාහ, හා දික්කසාද ඉල්ලීම් මත තීරණ ගැනීම.
- ➢ උඩරට විවාහ, දික්කසාද ලියාපදිංචි කිරීම.

1.1.2 භාරකාරත්වය සහ ලේඛන සංරක්ෂණය.

ඉහත ලේඛන, නොතාරිස් ඔප්පු දෙවන පිටපත් හා සංරක්ෂණය කළ යුතු අනෙකුත් ලියවිලි හා ලේඛන වල භාරකාරත්වය සහ සංරක්ෂණය කිරීම.

1.1.3 සහතික පිටපත් නිකුත්කිරීම.

සහතික පිටපත් නිකුත් කිරීමට නියමිත සියළු ලේඛන වල සහතික කළ පිටපත් එසේ ලබා ගැනීමට බලය ලත් පුද්ගලයින්ට නිකුත් කිරීම.

## 1.2 අනුෂාංගික ක්‍රියාකාරකම්

- විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් පත් කිරීම හා පාලනය .
- නොතාරිස්වරුන් පත් කිරීම හා පාලනය.
- ඔප්පු මත හා වෙනත් ලියවිලි මත නියමිත මුද්දර ගාස්තු ගෙවන බවට සහතික වීම.
- සහතික පිටපත් වල පරිවර්තන නිකුත් කිරීම.
- සංශෝධන කිරීම.
- ජීව සංඛ්‍යාති වාර්තා ප්‍රකාශයට පත් කිරීම.
- නිවාඩු ආඥා පනත ක්‍රියාත්මක කිරීම.

## 1.3 දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය

2017.12.31දිනට
දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

| තනතුර | සේවය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| රෙජිස්ට්‍රාර් ජනරාල් | | 1 | - | 1 |
| අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් | රෙජිස්ට්‍රාර් සේවය (විශේෂ ශ්‍රේණිය) | 1 | - | 1 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන) | ශ්‍රී. ලං. ප. සේවය | 1 | - | 1 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් | රෙජිස්ට්‍රාර් සේවය (1-1 ශ්‍රේණිය ) | 2 | 1 | 1 |
| නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්/ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන) | ශ්‍රී ලං. ප.සේවය | 1 | 1 | - |
| නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්/ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන) | රෙජිස්ට්‍රාර් සේවය (11-111 ශ්‍රේණිය ) | 31 | 11 | 20 |
| ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ලං.ග.සේවය (1 ශ්‍රේණිය ) | 1 | 1 | - |
| ගණකාධිකාරී | ශ්‍රී ලං.ග.සේවය (11-111 ශ්‍රේණිය ) | 2 | 2 | - |
| ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) | ශ්‍රී ලං.ග.සේවය (11-111 ශ්‍රේණිය ) | 1 | - | 1 |
| සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | ශ්‍රී ලං.තො.හා.සං.තා.සේවය (11-111 ශ්‍රේණිය ) | 1 | - | 1 |
| නීති නිලධාරී | දෙපාර්තමේන්තුගත | 1 | - | 1 |
| ඉඩම් රෙජිස්ට්‍රාර් / හිමිකම් රෙජිස්ට්‍රාර් | රෙජිස්ට්‍රාර් සේවය (11 ශ්‍රේණිය ) | 45 | 41 | 4 |
| පරිපාලන නිලධාරී | රා.කළ.ස.සේවය (අධි ) | 1 | - | 1 |
| භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | 1 | - | 1 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ නිලධාරී | ශ්‍රී ලං.තො.හා.සං.තා.සේවය | 2 | 1 | 1 |
| අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් | රෙජිස්ට්‍රාර් සේවය (111 පන්තිය 111/11/1 ශ්‍රේණිය) | 537 | 480 | 57 |
| සංවර්ධන නිලධාරී | ආශ්‍රිත සේවය | 400 | 367 | 33 |
| අයවැය සහකාර | ආශ්‍රිත සේවය | 1 | - | 1 |
| කාර්මික නිලධාරී | දෙපාර්තමේන්තුගත | 1 | - | 1 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.කළ.ස.සේවය | 946 | 745 | 201 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රී ලං.තො.හා.සං.තා.සේවය | 12 | 6 | 6 |
| ලේඛණ සහකාර | දෙපාර්තමේන්තුගත | 209 | 183 | 26 |
| පොත් බැඳුම්කරු | දෙපාර්තමේන්තුගත | 77 | 31 | 46 |
| රියදුරු | රියදුරු සේවය | 18 | 17 | 1 |
| කාර්යාල කාර්ය සහයක | කා.සේ.සේවය | 369 | 352 | 17 |
| | | 2662 | 2239 | 423 |

## 1.4 පනත් සහ ආඥා පනත්

### 1.4.1 ඉඩම් ලියාපදිංචි කිරීම

- ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත
- සන්නස් සහ පැරණි ඔප්පු ආඥා පනත
- පැරණි ඔප්පු හා ලියවිලි ලියාපදිංචි කිරීමේ ආඥා පනත
- ඉඩම් ලේඛන) පත්ඉරු නැවත සකස් කිරීමේ (ආඥා පනත
- නොතාරිස් ආඥා පනත
- හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත
- ඇටෝර්නි බලපත්‍ර ආඥා පනත
- බද්ධ නිවාස අයිතිවාසිකම් පනත
- මුද්දර ගාස්තු පනත
- මුදල් පනත

### 1.4.2 විවාහ,උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම

- උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත
- මරණ ලියාපදිංචි කිරීමේ) විශේෂ විධිවිධාන (පනත
- විවාහ) සාමාන්‍ය (ලියාපදිංචි කිරීමේ ආඥා පනත
- උඩරට විවාහ දික්කසාද පනත
- උඩරට අනුප්‍රප්තික ආඥා පනත
- මුස්ලිම් විවාහ හා දික්කසාද පනත
- ළමයින් දරුකමට හදා ගැනීමේ පනත

# ලියාපදිංචිය හා සබැඳි අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට ජනතාවට සහාය වීම




# II පරිච්ඡේදය

## ලේඛන ලියාපදිංචි කිරීම

### 2.1 නොතාරිස්වරුන් පිළිබඳ විස්තර


2017 වර්ෂය තුළ කටයුතු කළ නොතාරිස් වෘත්තියේ යෙදුනු නීතීඥ සහ නීතීඥ නොවන නොතාරිස්වරුන්ගේ ගණන සහ ඔවුන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අංකය | විස්තරය | නීතීඥ නොතාරිස්වරු | | නීතීඥ නොවන නොතාරිස්වරු | | මුළු ගණන | |
|---|---|---|---|---|---|---|---|
| | | 2016 | **2017** | 2016 | **2017** | 2016 | **2017** |
| 1 | වර්ෂය තුළ අළුතින් වෘත්තීය ආරම්භ කළ ගණන | 600 | **746** | 6 | **11** | 606 | **757** |
| 2 | වසර තුළ ඉල්ලා අස් වූ ගණන | 31 | **73** | 6 | **3** | 37 | **76** |
| 3 | වසර තුළ කටයුතු අත්හිටවූ ගණන | 0 | **0** | 0 | **0** | 0 | **0** |
| 4 | වසර තුළ මිය ගිය ගණන | 27 | **27** | 12 | **12** | 39 | **39** |
| 5 | දෙසැම්බර් 31 දිනට වෘත්තියේ යෙදී සිටි ගණන | 11,734 | **11,734** | 385 | **385** | 12,119 | **12,119** |




## 2.2 2017 වර්ෂය තුළ නිකුත් කළ නොතාරිස් බලපත්‍ර සංඛ්‍යාව

- අලුතින්ම නිකුත් කළ නොතාරිස් බලපත්‍ර සංඛ්‍යාව - ***992***
- අතිරේක භාෂාවෙන් කටයුතු කිරීම සඳහා - ***461***
- අධිකරණ කලාපය වෙනස් කර ගැනීම සඳහා - ***231***





## 2.3 ඉඩම් ලේඛන ලියාපදිංචි කිරීමේ දෝෂ නිවැරදි කිරීම

- 2017 වර්ෂය සඳහා ලද ඉල්ලීම් සංඛ්‍යාව - ***3174***
- 2017 වර්ෂය සඳහා වැඩ අවසන් කළ සංඛ්‍යාව - ***3169***




## 2.4 දිරාපත් ඉඩම් ලේඛන නැවත සකස් කිරීම

- ලද ඉල්ලීම් සංඛ්‍යාව - ***129***
- අනුමත කරන ලද සංඛ්‍යාව - ***52***





## 2.5 ලේඛන ලියාපදිංචිය

- 2017 වර්ෂය තුළ ලියාපදිංචියට ලද ඔප්පු සංඛ්‍යාව - **1,348,035**
- 2017 වර්ෂය තුළ ලියාපදිංචියට ලද ඇටෝර්නි බලපත්‍ර සංඛ්‍යාව - ***50,830***
- 2017 වර්ෂය තුළ ලියාපදිංචියට ලද හිමිකම් උපලේඛන සංඛ්‍යාව - 45,852




## 2.6 ලේඛන සංරක්ෂණය

- ➢ වර්ෂය තුළ ලද ඔප්පු දෙවන පිටපත් සංඛ්‍යාව - ***889,639***





## 2.7 ඉල්ලුම් පත්‍ර ලැබීම්

- ➢ ඉඩම් ලේඛණ උධෘත - ***1,179,613***
- ➢ ඔප්පු පිටපත් - ***216,634***
- ➢ ඇටෝර්නි බලපත්‍ර - ***190***
- ➢ හිමිකම් සහතික - ***9,152***




(ආ) ලේඛන සෙවීමට ලද ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව

- ඉඩම් ලේඛන - ***115,464***
- ඔප්පු හා වෙනත් ලේඛන - ***9,463***





## 2.8 *දෙපාර්තමේන්තුව විසින් අයකර ගන්නා ලද ගාස්තු ප්‍රමාණයන්*

- ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත,නොතාරිස් ආඥා පනත හා ඇටෝර්නි බලපත්‍ර ආඥා පනත යටතේ අය කළ ගාස්තු - 607,676,930



# ඔබගේ ඉඩමේ හිමිකම අපි වඩාත් තහවුරු කරන්නෙමු



# III වන පරිච්ඡේදය

## හිමිකම් ලියාපදිංචි කිරීම

1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතට අනුව ලේඛණ ලියාපදිංචි කිරීමේ ක්‍රමය වෙනුවට හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන ආරම්භ කර ඇත. මෙම වැඩසටහන ශ්‍රී ලංකාව තුළ "බිම්සවිය වැඩසටහන" නමින් මේ වන විට ආරම්භ කර ඇත. ඒ අනුව මේ වන විට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන යටතේ මෙරට ප්‍රමුඛ පෙළේ සංවර්ධන වැඩසටහනක් ලෙස බිම්සවිය වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක වෙමින් පවතී.

මෙම වැඩසටහන යටතේ 2017 වර්ෂය තුළ පුත්තලම ඉඩම් කාර්යාලයේ හිමිකම් ලියාපදිංචි කිරීම ආරම්භ කිරීමට හැකි වූ අතර එම වර්ෂය තුළ හිමිකම් ලියාපදිංචි කිරීම ක්‍රියාත්මක වන කාර්යාල සහ ඒ එක් එක් කාර්යාල වලින් ලියාපදිංචි කරන ලද ඉඩම් කැබලි ප්‍රමාණය පහතින් සඳහන් කර ඇත.

### 3.1 හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ කාර්යාල

| අංකය | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය | වර්ෂයේ ලියාපදිංචි කර ඇති ඉඩම් කැබලි ප්‍රමාණය | 2016 අවසන් වන විට ලියාපදිංචි කර ඇති මුළු ඉඩම් කැබලි ප්‍රමාණය | | අංකය | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය | වර්ෂයේ ලියාපදිංචි කර ඇති ඉඩම් කැබලි ප්‍රමාණය | 2016 අවසන් වන විට ලියාපදිංචි කර ඇති මුළු ඉඩම් කැබලි ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | අනුරාධපුරය | 4697 | 82180 | | 14 | ත්‍රිකුණාමලය | 144 | 1370 |
| 2 | ගම්පහ | 4633 | 35501 | | 15 | මාතලේ | 1790 | 12126 |
| 3 | ගම්පොළ | 728 | 34144 | | 16 | කුලියාපිටිය | 448 | 6086 |
| 4 | මීගමුව | 2657 | 44872 | | 17 | නුවරඑළිය | 299 | 4745 |
| 5 | රත්නපුර | 5307 | 66737 | | 18 | පානදුර | 1427 | 5536 |
| 6 | හෝමාගම | 1305 | 56870 | | 19 | ගාල්ල | 1404 | 7151 |
| 7 | හම්බන්තොට | 2786 | 27555 | | 20 | මාතර | 2408 | 10212 |
| 8 | මහනුවර | 2743 | 31024 | | 21 | අත්තනගල්ල | 1164 | 8220 |
| 9 | දෙල්කඳ | 3458 | 56627 | | 22 | මාරවිල | 432 | 1195 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 10 | කුරුණෑගල | 3022 | 26635 | | 23 | කළුතර | 1269 | 4312 |
| 11 | මොණරාගල | 3048 | 18930 | | 24 | කෑගල්ල | 543 | 924 |
| 12 | බදුල්ල | 92 | 11053 | | 25 | තංගල්ල | 1498 | 1627 |
| 13 | පොළොන්නරුව | 2395 | 21668 | | | **එකතුව** | 49,697 | 577,300 |

2017 වර්ෂය තුල ලියාපදිංචිය සඳහා 60,134 ක හිමිකම් උපලේඛණ ප්‍රමාණයක් ලැබී තිබෙන අතර ලියාපදිංචි කල මුළු හිමිකම් උපලේඛණ ප්‍රමාණය 49,697 ක් වේ.

## 3.2 පුහුණු වැඩසටහන්

බිම්සවිය වැඩසටහන සම්බන්ධයෙන් ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් සහ හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සංවිධානයෙන් පවත්වනු ලබන සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දැනුවත් කිරීමේ වැඩසටහන්වලට සහ ගම් මට්ටමින් සංවිධානය කරනු ලබන ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්වලට ද මෙම දෙපාර්තමේන්තුවේ දායකත්වය ලබා දී ඇත.


නව මෘදුකාංගය භාවිතයෙන් හිමිකම් ලියාපදිංචිය සිදු කිරීම සම්බන්ධව හිමිකම් කාර්යාලවල නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් වරින් වර ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලදී.

## 3.3 මූල්‍ය සහ යටිතල පහසුකම්

2017 වර්ෂය තුල හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාල සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සකස් කිරීමට බිම් සවිය වැඩසටහන යටතේ ප්‍රතිපාදන ලබා දී ඇත.

එමෙන්ම 2017 වර්ෂය අවසානයේ දී හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම රු.***23,130,366.00*** ක් වූ අතර රු ***8,668,146.40*** ක මුදලක් පසුගනුදෙනු සාධන පත්‍ර ලියාපදිංචි කිරීම තුලින් හිමිකම් රක්ෂණ අරමුදලට බැරකිරීමට හැකිවිය. එසේම 201***6*** වර්ෂයට වඩා 201***7*** වර්ෂය තුල රු ***583,549.90*** ක මුදලක් රක්ෂණ අරමුදලට බැර කිරීමට හැකියාව ලැබුණි. ***2017*** වර්ෂයේ හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායමෙන් රු ***8,636,386.73*** ක මුදලක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීමට හැකියාව ලැබුණි.


පසුගිය වසරක කාලය තුළ බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුවට ලැබී ඇති ප්‍රතිපාදන සහ වියදම පහත දැක්වේ.




ප්‍රතිපාදන

## 3.4 පසුගනුදෙනු ලියාපදිංචි කිරීමේ ප්‍රගතිය

බිම්සවිය වැඩසටහන යටතේ 2016 වර්ෂයේ පසු ගනුදෙනු සාධන පත්‍ර ***32501*** ක් ද 2017 වර්ෂයේ පසු ගනුදෙනු සාධන පත්‍ර ***32,580*** ක්ද ලියාපදිංචි කරන ලදී. මෙම වැඩසටහන යටතේ හිමිකම් කාර්යාල 28 හි ලියාපදිංචි කරන ලද ලියාපදිංචි කරන ලද පසු ගනුදෙනු සංඛ්‍යාව පහත දැක්වේ.



## 3.5 දෙපාර්තමේන්තුව විසින් අයකර ගන්නා ලද ගාස්තු ප්‍රමාණයන්

| | කාරණය | ගාස්තු (රු.) |
|---|---|---|
| 1 | හිමිකම් ලේඛණ උධෘත සහ හිමිකම් සහතික පිටපත් නිකුත් කිරීමේ ගාස්තු | 13,568,207.00 |
| 2 | හිමිකම් සාධන පත්‍ර වෙනුවෙන් පළාත් පාලන ආයතන වලට හෝ රජයට අය කරන ලද මුද්දර ගාස්තු | 827,895,980.47 |

## 3.6 E- land Register වැඩසටහන

මෙම හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන කඩිනම් කිරීමට අදාලව ඉඩම් සංවර්ධන අමාත්‍යංශයේ ප්‍රතිපාදන යටතේ ඉඩම් ලේඛන පරීක්ෂා කිරීම මාර්ගගතව සිදු කිරීම පිණිස ***eland register*** වැඩසටහන යටතේ කොළඹ, දෙල්කඳ, ගම්පහ, අත්තනගල්ල, යාපනය සහ මන්නාරම යන ඉඩම් කාර්යාලවල ඉඩම් ලේඛන 5,399,457 ක් පරිලෝකනය කර දත්ත ඇතුලත් කිරීම සිදු කරන ලදී.

2016 වසරේදී කළුතර, මතුගම , ඇල්පිටිය, බලපිටිය, ගාල්ල, මාතර, කොටපොල, තංගල්ල, හම්බන්තොට යන කාර්යාලවලට අදාල ඉඩම් ලේඛණ පත්ඉරු 4,286,634ක ප්‍රමාණයක් පරිලෝකනය කර දත්ත ඇතුලත් කිරීම සඳහා රු. මිලියන 51.98 ක් වැය කරන ලදී.

ඉඩම් ලේඛන ලියාපදිංචි කිරීමේ කටයුතු පරිගණක ආශ්‍රයෙන් සිදුකිරීම සඳහා පරිගණක මෘදුකාංගයක් නිර්මාණය කරන ලදී. වර්තමානය වන විට එදිනෙදා ලියාපදිංචි කිරීම සඳහා ලැබෙන ලේඛන ප්‍රමාණය අධික වන බැවින් ලියාපදිංචි කිරීමේ කටයුතු කාර්යයක්ෂම කිරීම සඳහා මෙය හඳුන්වා දී ඇත. 2017 වසරේදී ඉඩම් ලේඛන පරිලෝකනය කරන ලද කාර්යාල 15න් 06ක ***e land register*** මෘදුකාංගය නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරනු ලැබේ.

එමෙන්ම මෙම ඉඩම් ලේඛණ පරිලෝකනය කිරීමෙන් පසුව එකී ඉඩම් ලේඛණවල ලියාපදිංචි කරනු ලබන තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා දත්ත පද්ධතියක් සකස් කරන ලද අතර ඒ සඳහා රු. මිලියන 5.01 ක ප්‍රමාණයක් වැය කරන ලදී. මීට අමතරව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර වැනි උපකරණ ලබා දීමට කටයුතු කරන ලද අතර ඒ සඳහා රු.මිලියන 30 ක මුදලක් වැය කරන ලදී.

# විවාහ උපත් සහ මරණ ලියාපදිංචි කිරීමෙන් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහාය දෙමු




# IV වන පරිච්ඡේදය

## සිවිල් ලියාපදිංචි කිරීම


### 4.1 රෙජිස්ට්‍රාර්වරු

2017.12.31 දිනට සේවයේ යෙදී සිටි රෙජිස්ට්‍රාර්වරුන්ගේ ගණන 1,411 කි. ඔවුහු පහත සඳහන් වර්ග වලට අයත් වේ.

| | රෙජිස්ට්‍රාර්වරුන්ගේ වර්ග | 2016 | 2017 |
|---|---|---|---|
| 1 | විවාහ , උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර්වරු | 590 | 699 |
| 2 | විවාහ (අතිරේක) රෙජිස්ට්‍රාර්වරු | 191 | 197 |
| 3 | උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරු | 44 | 53 |
| 4 | උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරු | 48 | 31 |
| 5 | මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්වරු | 289 | 277 |
| 6 | විවාහ රෙජිස්ට්‍රාර්වරු | | 107 |
| 7 | දෙමළ රෙජිස්ට්‍රාර්වරු | | 47 |
| | මුළු ගණන | 1,162 | 1,411 |




## 4.2 ලියාපදිංචි කරන ලද විවාහ, උපත් සහ මරණ සංඛ්‍යාව





| | විවාහ | උපත් | මරණ |
|---|---|---|---|
| 2016 | 173990 | 331073 | 130765 |
| 2017 | 169365 | 326052 | 139822 |

## 4.3 විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල මගින් ලියාපදිංචි කරන ලද විවාහ, උප්පැන්න හා මරණ සංඛ්‍යාව





| | විවාහ | උපත් | මරණ |
|---|---|---|---|
| 2016 | 169 | 9879 | 535 |
| 2017 | 268 | 12574 | 636 |


## 4.4 විවාහ, උප්පැන්න හා මරණ සහතික සහ අනුමාන වයස් සහතික




## 4.5 වි.උ.ම ලේඛන පරිවර්තන ඉල්ලීම් සංඛ්‍යාව



## 4.6 වි.උ.ම ලේඛන පරිවර්තන නිකුත් කළ පිටපත් සංඛ්‍යාව




## 4.7 අනුමත කරන ලද ප්‍රකාශ පත්‍ර පිළිබඳ තොරතුරු

| කාරණය | ලද ප්‍රකාශ පත්‍ර සංඛ්‍යාව |
|---|---|
| පසුගිය උපත් ලියාපදිංචි කිරීම. | 12,927 |
| නම් වෙනස් කිරීම් හා සංශෝධන කිරීම. | 8,110 |
| පසුගිය මරණ ලියාපදිංචි කිරීම. | 920 |
| ලිපි දෝෂ හා වෙනත් අනුශාංගික තොරතුරු නිවැරදි කිරීම. | 8,726 |

## 4.8 නිකුත් කරන ලද අනුමාන වයස් සහතික සංඛ්‍යාව

නිකුත් කරන ලද අනුමාන වයස් සහතික සංඛ්‍යාව - ***3,232***

## 4.9 විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල මගින් ලද ප්‍රකාශ පත්‍ර මත අනුමත කල ප්‍රකාශ පත්‍ර සංඛ්‍යා

| වගන්තිය | ලද ප්‍රකාශ පත්‍ර සංඛ්‍යාව | අනුමත කළ ප්‍රකාශ පත්‍ර සංඛ්‍යාව |
|---|---|---|
| 24 | 1182 | 1182 |
| 27 | 202 | 202 |
| 27ඒ | 173 | 173 |
| 36 | 487 | 487 |
| 52 | 177 | 177 |

## 4.10 විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල මගින් ලද උධෘත සහ පිටපත් ඉල්ලීම්

| වගන්තිය | ලද ඉල්ලීම් සංඛ්‍යාව |
|---|---|
| උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනත | 19 176 |
| විවාහ (සාමාන්‍ය) ලියාපදිංචි කිරීමේ පනත | 187 |
| උඩරට විවාහ සහ දික්කසාද පනත | 90 |
| මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත | 74 |

## 4.11 දරුකමට හදාවඩා ගැනීම් සම්බන්ධව තොරතුරු

- දරුකමට හදා වඩා ගැනීමේ ආඥා පනත යටතේ අධිකරණය මගින් නිකුත් කරන ලද නියෝග සංඛ්‍යාව - 1245
- දරුකමට හදාවඩා ගැනීමේ සහතික පිටපත් - 1687
- දරුකමට හදාවඩා ගත් ළමයින්ගේ උපත් ලියාපදිංචිය - 1226

## 4.12 මුද්දර ගාස්තු හා වෙනත් ගාස්තු

2016 වර්ෂය තුළ විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අය කර ගන්නා ලද මුද්දර ගාස්තු හා වෙනත් ගාස්තු පහත දැක්වේ.

| | කාරණය | රු. |
|---|---|---|
| 1. | උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත, විවාහ (සාමාන්‍ය) ලියාපදිංචි කිරීමේ පනත, උඩරට විවාහ සහ දික්කසාද පනත හා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත යටතේ අය කර ගත් ගාස්තු | 334,572,042 |

# V වන පරිච්ඡේදය

## තොරතුරු තාක්ෂණයේ ප්‍රගතිය

## උප්පැන්න, මරණ සහ විවාහ සහතික පරිගණක භාවිතයෙන් සහතික පත් නිකුත් කිරීම

**e-BMD**

උප්පැන්න , මරණ සහ විවාහ සහතික පරිලෝඛනය කර පරිගණක භාවිතයෙන් සහතික පිටපත් නිකුත් කිරීම මේ යටතේ කරනු ලැබේ. 2017 වර්ෂය අවසාන වන විට පහත දැක්වෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් නවීන තාක්ෂණය යොදා පරිගණක මගින් සහතික නිකුත් කිරීමට පියවර ගෙන තිබේ.

| | පිටපත් නිකුත් කරන කාර්යාල | සහතිකය අයත් වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
|---|---|---|
| 1 | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල | දිවයිනේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් වන සහතික |
| 2 | ගාල්ල දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල | දිවයිනේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් වන සහතික |
| 3 | කුරුණෑගල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල | දිවයිනේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් වන සහතික |
| 4 | වවුනියාව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය | දිවයිනේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් වන සහතික |
| 5 | යාපනය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය | දිවයිනේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් වන සහතික |
| 6 | නල්ලූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | දිවයිනේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් වන සහතික |
| 7 | කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල | කොළඹ දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් වන සහතික |
| 8 | අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල | අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් වන සහතික |
| 9 | බදුල්ල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල | බදුල්ල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් වන සහතික |

| | | |
|---|---|---|
| 10 | කෑගල්ල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල | කෑගල්ල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් වන සහතික |
| 11 | මොණරාගල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල | මොණරාගල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් වන සහතික |
| 12 | යාපනය දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල | යාපනය දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් වන සහතික |
| 13 | පුත්තලම දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල | පුත්තලම දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් වන සහතික |
| 14 | රත්නපුර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල | රත්නපුර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් වන සහතික |
| 15 | මාතලේ දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල | මාතලේ දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් වන සහතික |
| 16 | අම්පාර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල | අම්පාර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් වන සහතික |
| 17 | හම්බන්තොට දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල | හම්බන්තොට දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් වන සහතික |
| 18 | නුවරඑළිය දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල | නුවරඑළිය දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් වන සහතිකය |
